# රජයේ දැන්වීමයි

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019

**ප්‍රතිඵල නැවත සමීක්ෂණය**

උක්ත විභාගයේ ප්‍රතිඵල 2020.04.27 දින නිකුත් කර ඇත.

මෙම විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද සෙ.මී. 30 x සෙ.මී. 20 ප්‍රමාණයේ **ඉල්ලුම්පත්‍ර 2020.07.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ, විභාග කොමසාරිස් ජනරාල්, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරෙහි "**ප්‍රතිඵල නැවත සමීක්ෂණය - අ.පො.ස. (සා.පෙළ) විභාගය 2019**" යන්න සඳහන් කළ යුතුය.

ප්‍රතිඵල නැවත සමීක්ෂණයේදී අදාළ උත්තරපත්‍ර, නැවත සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිපදෙනෙකු යටතේ සම්පූර්ණයෙන්ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස ලකුණුවල හා ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි.

**ඉල්ලුම්පත් පිළියෙල කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.**

01. පාසල් අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර අදාළ විදුහල්පති මගින් ද, පෞද්ගලික අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තමා විසින්ම ද ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. ඉල්ලුම්පත්‍ර ආදර්ශ ආකෘතිය අනුවම පිළියෙල කළ යුතුය.

03. එක් විෂයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 200/- කි. තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ නියමිත ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබාගෙන **එය ඉල්ලුම්පත්‍රයෙහි පසුපිටෙහි නොගැලවෙන සේ හොඳින් අලවා එවිය යුතුය.** මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ අංකය ද, ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද අයදුම්කරු ළඟ තබාගත යුතුය. (මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම වඩාත් යෝග්‍ය වේ.)

04. මුද්දර, චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

05. එක් විෂයකට එක් ඉල්ලුම්පත්‍රය බැගින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

06. ප්‍රතිඵල ලේඛනයේ දක්වා ඇති පරිදි විෂය අංකය හා විෂයය, විභාග අංකය, ලැබූ ශ්‍රේණිය, මාධ්‍යය සහ විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම නිවැරදිව ලිවිය යුතුය. උපදෙස් හොඳින් කියවා ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ. **විශේෂයෙන් 01 (i) හි විෂය අංකය හා විෂයය ගැළපීම සහ 01 (ii) හි විභාග අංකය නිවැරදි විය යුතුය.**

07. **අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු සපයා ඇති හෝ නියමිත දිනට පසුව එවන හෝ අදාළ ගාස්තුව ගෙවා නොමැති හෝ ඉල්ලුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි ඉල්ලුම්පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

08. පෞද්ගලික අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍රයෙහි 01 සිට 06 දක්වා තොරතුරු පමණක් සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ.

09. මෙම දැන්වීම සහ ආදර්ශ ඉල්ලුම්පත්‍රය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ ද පළ කර ඇත.

ඇගයීම් (පාසල් විභාග) ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.
2020.06.24

බී.සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

ආදර්ශ ඉල්ලුම්පත්‍රය - (සෙ.මී. 30 x සෙ.මී 20)

**එක් විෂයක් සඳහා එක් ඉල්ලුම්පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතුය.**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019

## ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම්පත්‍රය

01. (i)

| නැවත සමීක්ෂණය කළ යුතු විෂය අංකය හා විෂයය | | අනුක්‍රමික අංකය (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි) |
|---|---|---|
| | | |

(ii)

| විභාග අංකය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(iii) ලැබූ ශ්‍රේණිය: ☐ (iv) මාධ්‍යය: ☐

(v) විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම: ....................................................................................................

02. (i) ඉල්ලුම්කරුගේ නම: පූජ්‍ය ........................................................................................................ මයා/මිය/මෙනෙවිය (මුලකුරු සමඟ)

(ii) පෞද්ගලික ලිපිනය: ........................................................................................................................

(iii) ජා.හැ. අංකය: ☐☐☐☐☐☐☐☐☐☐☐☐ (iv) දුරකථන අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

03. ඔබ පාසල් අයදුම්කරුවෙක් ද? ඔව් ☐ නැත ☐

04. රු. 200/- (රුපියල් දෙසීය) ගෙවූ කුවිතාන්සියේ විස්තර:

(i) කුවිතාන්සි අංකය: ........................................................... (ii) දිනය: ...........................................................

(iii) තැපැල් / උප තැපැල් කාර්යාලය: ...................................................................................................

05. **තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි මෙහි පසුපිටෙහි අලවන්න. එහි ඡායාපිටපතක් ඔබ ළඟ තබාගන්න. කුවිතාන්සියේ මුල් පිටපත අලවා නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

06. **අයදුම්කරුගේ ප්‍රකාශය:**

මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. යම් අසත්‍ය තොරතුරක් සපයා තිබේ නම් මෙම ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබීමට ද, නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන වෙනසකදී ලකුණුවල සහ ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ භාර ගැනීමට ද, නැවත සමීක්ෂණය පිළිබඳ නීතිරීතිවලින් බැඳී සිටීමට ද එකඟ වන බව ප්‍රකාශ කරමි.

දිනය : ...................................................... ......................................................................

අයදුම්කරුගේ අත්සන

07. **පාසල් අයදුම්කරුවන් සඳහා විදුහල්පතිගේ සහතිකය :**

ඉහත සඳහන් අයදුම්කරු මාගේ විදුහලේ ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක බවත්, මෙහි සඳහන් විෂය අංකය හා විෂයය, විභාග අංකය, ලැබූ ශ්‍රේණිය, මාධ්‍යය හා විභාග මධ්‍යස්ථානයේ නම ප්‍රතිඵල ලේඛනය අනුව නිවැරදි බවත්, මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත මෙම අයදුම්පතේ පසුපිටෙහි අලවා ඇති බවත් සහතික කරමි.

......................................................................

නිල මුද්‍රාව: විදුහල්පතිගේ අත්සන හා දිනය

**සැ.යු.** 1. පෞද්ගලික අයදුම්කරුවන් 01 සිට 06 දක්වා පමණක් සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්වේ.

2. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර **විභාග කොමසාරිස් ජනරාල්, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන්න.